# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1887/21 - 2014 නොවැම්බර් මස 05 වැනි බදාදා - 2014.11.05**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කිරීම් - සංශෝධන අංක 01

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1836/6 හා 2013 නොවැම්බර් මස 11 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 6.1, 6.2, 7.2.4.2 සහ 20.1.3 වගන්ති පහත පරිදි සංශෝධනය කරනු ලැබේ :

6.1 සේවයේ අනුමත ශ්‍රේණි, තනතුරු නාම සහ තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

<table>
<tr><th>ශ්‍රේණිය</th><th>අනුමත තනතුරු සංඛ්‍යාව</th><th>කාර්යයන්</th></tr>
<tr><td>විශේෂ ශ්‍රේණිය</td><td>23</td><td rowspan="2">ආයතනයට පැවරෙන ඉංජිනේරුමය විෂය පථයට අදාළව ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අදාළ වන්නා වූ ක්‍රමසම්පාදන මාර්ගෝපදේශයන් සහ ක්‍රමෝපායන් සකස් කිරීම ක්‍රියාත්මක කිරීම, සමාජ ආර්ථික සංවර්ධනයට ඉවහල් වන්නා වූ ප්‍රතිපත්ති / උපාය මාර්ග / සැලසුම් / වැඩසටහන් / ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, ඇගයීම අධීක්ෂණය හා ජාතික මට්ටමේ කළමනාකරණය කිරීම.</td></tr>
<tr><td>I ශ්‍රේණිය</td><td>187</td></tr>
<tr><td>I/II හා II ශ්‍රේණි</td><td>35</td><td rowspan="2">ආයතනයට පැවරෙන ඉංජිනේරුමය විෂය පථයට අදාළව ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අදාළවන්නා වූ ඉංජිනේරුමය මාර්ගෝපදේශයන් සහ ක්‍රමෝපායන් සකස් කිරීම, සමාජ ආර්ථික සංවර්ධනයට ඉවහල් වන්නා වූ ප්‍රතිපත්ති / උපායමාර්ග/ සැලසුම් / වැඩසටහන් / ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, ඇගයීම අධීක්ෂණය හා මධ්‍යම මට්ටමේ කළමනාකරණය.</td></tr>
<tr><td>II / III ශ්‍රේණි</td><td>1086</td></tr>
</table>



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

6.2 උසස් කිරීම් සඳහා ඒකාබද්ධ නිලධාරීන් සංඛ්‍යාව ෑ
(සේවයට අයත් තනතුරු නාම පරිශිෂ්ට 1 හි දැක්වේ)

| | | |
|---|---|---|
| පරිශිෂ්ට 1 අනුව ශ්‍රේණි I, II සහ III ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව | = | 1308 |
| විශේෂ ශ්‍රේණිය | = | 23 |

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා පළමුවන (I) ශ්‍රේණිය, දෙවන (II) ශ්‍රේණිය හා තුන්වන (III) ශ්‍රේණිය යන ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

සටහන ෑ රාජ්‍ය සේවයේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි කලින් කලට මෙම නිලධර සංඛ්‍යාව වෙනස් විය හැකිය.

7.2.4.2 ඉහත 7.2.3.3.vi යටතේ සුදුසුකම් ලබන කාර්මික නිලධාරින් සඳහා උපරිම වයස් සීමාව අවුරුදු 45 වනු ඇත. (මෙම සුදුසුකම වලංගු වන්නේ මෙම සේවා ව්‍යවස්ථාව ප්‍රසිද්ධ කරන දින දක්වා සේවයට බැඳී සිටින නිලධරයන් සඳහා පමණි).

20.1.3 සේවයේ විශේෂ ශ්‍රේණියට පත්කිරීම

(i) අන්තර්කාලය තුළ සේවයේ විශේෂ ශ්‍රේණියට පත්කිරීම මෙම ව්‍යවස්ථාවේ 10.3 හි දැක්වෙන පරිදි සිදුකරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ටී. එම්. එල්. සී. සේනාරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

11 - 579

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.